ලංකාදීප

www.lank

TRIBUTION IS STRI

# තව පමා නොකර පළාත් සභා ඡන්දය තියන්න

## පැෆරල් ආණ්ඩුවෙන් ඉල්ලයි

■ නිමල කොඩිතුවක්කු

**තවදුරටත් ප්‍රමාද නොකර පොරොන්දු වූ පරිදි කඩිනමින් පළාත් සභා මැතිවරණය පවත්වන්නැයි පැෆරල් සංවිධානය ආණ්ඩුවෙන් ඉකුත්දා (5) ඉල්ලීමක් කළේය.**

පළාත් සභා මැතිවරණය පැවැත්වීම පිළිබඳව වර්තමාන ආණ්ඩුව කල් මැරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන බවට නිරීක්ෂණය වන බවත් එහි විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

පැෆරල් සංවිධානය කොළඹදී කැඳවූ මාධ්‍ය හමුවකදී අදහස් දැක්වූ රෝහණ හෙට්ටිආරච්චි මහතා තවදුරටත් මෙසේද කීවේය.

"වසර 14කින් පමණ බොහෝ පළාත්වල පළාත් සභා මැතිවරණයක් පවත්වා නැහැ. ඒ පළාත් සභා මහජන නියෝජිතයන්ගෙන් තොරව ආණ්ඩුකාරවරුන් යටතේ ක්‍රියාත්මක වනවා. පළාත් සභා මැතිවරණය පැවැත්වීම පිළිබඳව වර්තමාන ආණ්ඩුවත් කල් මැරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා කියලා අපට මේ වන විට නිරීක්ෂණය වෙනවා. ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉතාම පැහැදිලිව තිබෙනවා වසරක් තුළ පළාත් සභා මැතිවරණය පවත්වා අවසන් කරනවා කියලා. වසර එකහමාරක් ගත වුණත් පළාත් සභා මැතිවරණය පැවැත්වීමේ අවංක වුවමනාවක් මේ ආණ්ඩුවට පෙනෙන්නේ නැහැ.

පළාත් සභා මැතිවරණය ගැන කමිටුවක් පත්කරත්, ඒ කමිටු වාර්තාවල තීන්දුව ගැන තවමත් අපි දන්නේ නැහැ. පළාත් සභා මැතිවරණය තාක්ෂණික කරුණු මත දිගින් දිගටම කල්දැමීම තමයි ආණ්ඩු තුනක් මෙවලමක් විදිහට පාවිච්චි කළේ. අපට නිරීක්ෂණය වන කාරණාව තමයි පළාත් සභා මැතිවරණය පවත්වන්න අවශ්‍ය වන්නේ දේශපාලන තීන්දුවක් කියන එක. ආණ්ඩුව තීන්දු කරන ඕනෑම මොහොතක මාස තුනක් වගේ කාලයක් ඇතුළත අවශ්‍ය සංශෝධන සිදුකිරීමේ හැකියාව ආණ්ඩුවට තිබෙනවා. තවත් ප්‍රමාද නොකර කඩිනමින් පළාත් සභා මැතිවරණය පවත්වන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා.